# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2123/65 - 2019 මැයි මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2019.05.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය*: KDS/YNU/4/1/LD/D/499
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය*:
එල්/ඩී/05/2006/පීසී/180

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පළාත කෝරලේ සුළු කොට්ඨාසයේ මල්ගම්මන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද අංක 6490 දරන මූලික පිඹුරේ සඳහන් කැබලි අංක 01 වශයෙන් දැක්වෙන ගිරාගම වත්ත නමැති ඉඩමේ මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1909 ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස.

මායිම්

උතුරට: ප්‍රාදේශීය සභා මාර්ගය සහ කේ.පී.ආර් නිශ්ශංක හිමිකම් කියන පිටඅංගේවත්ත; නැගෙනහිරට: කේ.පී.ආර් නිශ්ශංක හිමිකම් කියන පිටඅංගේවත්ත පිටඅංගේ ගෙදර සෝමාවතී හිමිකම් කියන පිටඅංගේවත්ත සහ ටී.පී. පියදාස හිමිකම් කියන පිටඅංගේවත්ත; දකුණට: ඒ.පී. සෙන්දි හිමිකම් කියන පිට අංගේකුඹුර සහ මු.පි. A 1257 හි කැබලි අංක 29; බටහිරට: මු.පි. A 1257 හි කැබලි අංක 29 සහ ප්‍රාදේශීය සභා මාර්ගය.

**හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන්-**

01. කළමණාකරු,
පුසසැල්ලාව වැව්ලි සමාගම,
අංක 590,
ගාලුපාර,
කොළඹ 03

02. සාමාන්‍යාධිකාරි,
ජනතා වතු සංවර්ධන මණ්ඩලය,
අංක 55/75,
වෝක්ෂෝල් පටුමග.
කොළඹ 02

03. සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,
සී 87,
හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,
කොළඹ 07.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 ජූලි මස 17 වැනි දින පෙ.ව. 10.00 ට යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද 2019 ජූලි මස 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුයි.

යූ. පී. ඉන්දික අනුරුද්ධ පියදාස,
ප්‍රාදේශීය ලේකම්,
යටිනුවර,
පිළිමතලාව.

2019 අප්‍රේල් මස 22 වැනි දින,
යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05-873

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.